# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1805/39 - 2013 අප්‍රේල් මස 12 වැනි සිකුරාදා - 2013.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**මුදල් නීති පනත**

මුදල් නීති පනතේ (ලංකා නීති ප්‍රඥප්තියේ 422 වැනි අධිකාරය) 10 (ඇ), 93, 94, 96 සහ 97 වැනි වගන්ති යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පනවනු ලබන රෙගුලාසීන්ය.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

2013 අප්‍රේල් මස 12 දින.

**"ඇ" රෙගුලාසිය**

**සංචිත අවශ්‍යතා**

1. මුදල් නීති පනතේ 93 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා රුපියල් වලින් පවත්වාගෙන යනු ලබන තැන්පතු වගකීම් මත සංචිත පවත්වා ගත යුතුය.

2. (i) මුදල් නීති පනතේ 94 වගන්තියේ විධිවිධාන ප්‍රකාර, ඉහත අංක 1 රෙගුලාසියෙහි දක්වා ඇති පරිදි වාණිජ බැංකු විසින් ඔවුන්ගේ තැන්පතු වගකීම් මත පවත්වා ගත යුතු සංචිත අවශ්‍යතාවය වනුයේ එවැනි මුළු තැන්පතු වගකීම් වලින් සියයට 8කට සමාන ප්‍රමාණයකි.

(ii) ඉහත අංක 1 රෙගුලාසියෙහි දක්වා ඇති පරිදි තැන්පතු වගකීම් මත වාණිජ බැංකු විසින් පවත්වා ගත යුතු සංචිත අවශ්‍යතාවය රුපියල් තැන්පතුවක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ තැබිය යුතුය.

3. වාණිජ බැංකු විසින් පවත්වා ගතයුතු සංචිත අවශ්‍යතාවය ගණනය කිරීම සහ පවත්වා ගැනීම සඳහා සෑම මාසයක්ම කාලපරිච්ඡේද 2කට බෙදා ඇත (එනම්, 'අ' කාලපරිච්ඡේදය සහ 'ආ' කාලපරිච්ඡේදය).

i. **'අ' කාලපරිච්ඡේදය** 1 වන දින සිට 15 වන දින දක්වා (දෙදිනම ඇතුළත්ව) ; සහ

ii. **'ආ' කාලපරිච්ඡේදය** 16 වන දින සිට මාසයේ අවසන් දිනය දක්වා (දෙදිනම ඇතුළත්ව)

1A - G 17558 — 355 (2013/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. (i) ඕනෑම මාසයක 'අ' කාලපරිච්ඡේදයට අදාළව වාණිජ බැංකු විසින් පවත්වා ගත යුතු සංචිත අවශ්‍යතාවය ඊට පෙර මාසයේ 'අ' කාලපරිච්ඡේදයේ දෛනික තැන්පතු වගකීම්වල සාමාන්‍යය මත පදනම් විය යුතු අතර, ඕනෑම මාසයක 'ආ' කාලපරිච්ඡේදයට අදාළව පවත්වා ගත යුතු එම සංචිත අවශ්‍යතාවය ඊට පෙර මාසයේ 'ආ' කාලපරිච්ඡේදයේ දෛනික තැන්පතු වගකීම්වල සාමාන්‍යය මත පදනම් විය යුතුය.

(ii) දෛනික තැන්පතු වගකීම්වල සාමාන්‍යය ගණනය කිරීමේ දී තැන්පතු වගකීම්වල හර ශේෂයන් ශුන්‍ය ලෙස සැලකිය යුතු අතර බැර ශේෂයන්ට එරෙහිව ශුද්ධ අගය ගණනය කිරීම නොකළ යුතුය.

5. ඉහත අංක 4 රෙගුලාසියෙහි දක්වා ඇති තැන්පතු වගකීම්වලින් සියයට දෙකකට වැඩි වූද, සියයට හතරක් නොඉක්මවන්නා වූද, ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ මුදල් නෝට්ටු හා කාසි ස්වරූපයෙන් ස්වකීය සංචිතවල කොටසක් වශයෙන් පවත්වා ගත හැකිය. එවැනි මුදල් නෝට්ටු සහ කාසි ස්වරූපයෙන් තබාගත හැකි සංචිත ප්‍රමාණය ඊට අදාළ ගණනය කිරීමේ කාලපරිච්ඡේදයේ නෝට්ටු හා කාසිවල සාමාන්‍යය විය යුතුය.

6. වාණිජ බැංකු විසින් ඕනෑම දිනක් තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වා ගත යුතු අවම තැන්පතු සංචිත අවශ්‍යතා ප්‍රමාණය මහ බැංකුවේ දේශීය කටයුතු දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ විසින් චක්‍රලේඛයක් මගින් කලින් කලට වාණිජ බැංකු වෙත උපදෙස් දෙනු ඇත.

7. වාණිජ බැංකුවක් විසින් අනිවාර්යයෙන් පවත්වා ගතයුතු සංචිතවල ඌණතාවයක් ඇති වුවහොත් එම ප්‍රමාණය මත දිනකට සියයට එකෙන් දහයෙන් පංගුවක (0.1%) ප්‍රමාණයක පොළියක් ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතුය. එකී පොළිය පනතේ 96 වැනි වගන්තිය යටතේ සංචිත පවත්වා ගතයුතු කාලපරිච්ඡේදයෙන් පසුව එළඹෙන රාජකාරි දින පහකට නොවැඩි කාලයක් ඇතුළත ගෙවිය යුතුය.

8. දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා බලය දෙන යම් නිලධාරියෙකු විසින්

(අ) යම් වාණිජ බැංකුවල සංචිත ප්‍රමාණය සංචිත අවශ්‍යතා ප්‍රමාණයට වඩා අඩු බව ;

(ආ) සංචිතවල ඌණතාවය තිබූ කාලපරිච්ඡේදය ;

(ඇ) ඌණතාවයේ ප්‍රමාණය ; සහ

(ඈ) ඌණතා ප්‍රමාණය මත ගෙවිය යුතු පොලී ප්‍රමාණය.

සඳහන් කොට නිකුත් කරනු ලබන දැන්වීමක් එකී බැංකුවෙන් අය විය යුතු පොළී ප්‍රමාණය පිළිබඳව එකී බැංකුවට දෙන ලද ප්‍රමාණවත් දැන්වීමක් ලෙස සළකනු ලැබිය යුතුය.

9. සෑම වාණිජ බැංකුවක් විසින්ම මෙහි "අ" උප ලේඛනය යටතේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූල වූ වාර්තාවක් ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය කටයුතු අධ්‍යක්ෂ වෙත සැපයිය යුතුය.

**'අ' කාලපරිච්ඡේදයේ** ගණනය කිරීම් : එම මාසයේම 22 වන දින අවසානයට පෙර

**'ආ' කාලපරිච්ඡේදයේ** ගණනය කිරීම් : සැනෙකින් එළඹෙන මාසයේ 7 වන දින අවසානයට පෙර

වාර්තාව භාරදිය යුතු අවසාන දිනය නිවාඩු දිනයක් වූ විට මීළගට එළඹෙන ප්‍රථම රාජකාරි දිනය තුළ වාර්තාව භාර දිය යුතුය.

10. මෙම රෙගුලාසි 2013 මැයි මස 01 දින සිට බලපැවැත්වෙන අතර, ඒ සමග ශ්‍රී ලංකා රජයේ 2003 මාර්තු මස 20 වැනි දින අංක 1280/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ කලින් කලට සංශෝධනය කරනු ලැබූ "ඇ" රෙගුලාසිය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම රෙගුලාසියෙහි

"තැන්පතු වගකීම්" යන්නෙන් වාණිජ බැංකුවක වන පහත දැක්වෙන සියලු වගකීම් අදහස් වේ.

ඉල්ලුම් තැන්පතු, විශේෂ තැන්පතු, ඉතිරි කිරීමේ තැන්පතු, කාලීන තැන්පතු, වාණිජ බැංකුවක් නොවන වෙනත් ආයතනයක් මගින් අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි සිදු කර ඇති ස්ථාපිත කිරීම්, ණයවර ලිපිවලට එරෙහි ආන්තික, විශ්‍රාම වැටුප් අරමුදල් වැනි විශේෂ තැන්පතු යෝජනා ක්‍රම තිබේ නම් ඒවාද, ළමා තැන්පතු යෝජනා ක්‍රම හා එවැනි ස්වභාවයේ වෙනත් යෝජනා ක්‍රමද, එසේම භාරයන් වශයෙන් පවත්වාගෙන යන වත්කම් හෝ ස්වකීය ගනුදෙනු කරුවන් ශ්‍රී ලංකා මුදලින් පවත්වාගෙන යන තැන්පතු වගකීම්, නමුත් අන්තර් බැංකු තැන්පතු ඇතුළත් නොවේ.

"ඉල්ලුම් තැන්පතු" යන්නෙන් ශ්‍රී ලංකා රුපියල් වලින් නාමනය කරනු ලැබූ චෙක්පතකින්, අණකරයකින් හෝ ඇණවුමකින් ඉල්ලා සිටිය විට නීත්‍යානුකූල පිරිනැමීමක් වශයෙන් ගෙවීමට යටත් වන්නා වූ ද, වාණිජ බැංකුවල සියලු තැන්පතු වගකීම් අදහස් වන නමුත් කොන්දේසි මත ගෙවීමට යටත් වන එවැනි වගකීම් ඊට ඇතුළත් නොවේ.

"විශේෂ තැන්පතු" යන්නෙන් 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 10 වැනි වගන්තිය යටතේ යම් විශේෂ ගිණුමක තැන්පත් කරන ලද මුදල් වලින් පැන නැගෙන වාණිජ බැංකුවල ඇති සියලුම තැන්පතු වගකීම් අදහස් කෙරේ.

"ඉතිරි කිරීමේ තැන්පතු" යන්නෙන් ඉහත විස්තර කර ඇති පරිදි ඉල්ලුම් තැන්පතු, කාලීන තැන්පතු සහ විශේෂ තැන්පතු හැර ශ්‍රී ලංකා ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද සියලුම තැන්පතු වගකීම් අදහස් කෙරේ.

"කාලීන තැන්පතු" යන්නෙන්, කල් පිරෙන කාලසීමාවක් සඳහා භාර ගන්නා ලද ඉල්ලුම් කළ විටෙක ආපසු ලබාගත නොහැකි, පොළියක් සමග ආපසු ගෙවනු ලබන්නා වූ, ශ්‍රී ලංකා මුදලින් නාමනය කරන ලද සියලුම තැන්පතු වගකීම් අදහස් කෙරේ.

**"අ" උප ලේඛනය**

**වාර්තාවේ ආකෘතිය**

**දෛනික සාමාන්‍ය තැන්පතු වගකීම් පිළිබඳ වාර්තාව**

බැංකුවේ නම : ....................................................................................................................................................

........................................................................ සිට ................................................... දක්වා කාලපරිච්ඡේදය සඳහා

(දිනය) දිනය)

අධ්‍යක්ෂ,
දේශීය කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ 01.

මෙහි පහත සඳහන් තැන්පතු වගකීම්වල සාමාන්‍ය ප්‍රමාණය ඉහත සඳහන් කරන ලද පදනම් කාලපරිච්ඡේදයෙහි එක් එක් දින බැංකු කටයුතු අවසානයේ දී පොත්වල සඳහන් තැන්පතු ශේෂ පදනම් කොටගෙන සටහන් කරනු ලැබූ ඒවාය.

| I<br>*ඉල්ලුම් තැන්පතු* | II<br>*කාලීන තැන්පතු හා ඉතිරි කිරීමේ තැන්පතු* | II<br>*අනෙකුත් සියළුම තැන්පතු වගකීම් (විශේෂ තැන්පතු ණයවර ලිපිවලට එරෙහිව ආන්තික යනාදිය ද ඇතුළුව)* [*1] | IV<br>*මුළු ප්‍රමාණය* |
|---|---|---|---|
| | | | |

*1 තැන්පතු සහතික සම්බන්ධයෙන් ප්‍රකාශ කළ වටිනාකම විය යුත්තේ ඒවායේ ගෙවා ඇති වටිනාකමය.

**අවශ්‍ය සංචිත**

1. රු. .................................................................. න් ............................................. % රු. ..................................
   (දෛනික මුළු රුපියල් තැන්පතු වගකීම්වල සාමාන්‍යය)

2. තැන්පතු වගකීම්වල සාමාන්‍යයෙන් 2% කට වැඩි එහෙත් 4% නොඉක්මවන්නා වූ පවත්වා ගනු ලබන ශ්‍රී ලංකා මුදල් නෝට්ටු සහ කාසි වටිනාකම රු. ..................................

3. සංචිත පවත්වා ගන්නා කාලපරිච්ඡේද සඳහා පවත්වා ගත යුතු සංචිත අවශ්‍යතාවය (1 - 2) රු. ..................................

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවද, මෙම බැංකුවේ පොත්වලට අනුකූල බවද, ඉහත දක්වා ඇති ගණන් තත් කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියම කොට ඇති නියෝගවලට අනුකූල බවද අපි/මම මෙයින් සහතික කරමු/කරමි.

දිනය : ......................................

................................................
රාජකාරි අත්සන.

සටහන -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු හැරුණු විට අනෙක් ඕනෑම ආයතනයක් විසින් කරනු ලබන තැන්පතු සහ ස්ථාපිත කිරීම් නියම කරනු ලැබූ අනුපාතිකයන් අනුව අවශ්‍ය සංචිත පවත්වාගෙන යාම සඳහා ගණන් ගනු ලැබිය යුතුය.

(ආ) සියලුම ගණන් කිට්ටුම රුපියලට දැක්විය යුතුය.

05 - 18

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.